# චතාරික සමයේ තුන්වන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

දානියෙල් දිවැස්ප්‍රසාදීතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

(ද්.ස.ග්‍රු.) දානියෙල් 1 : 2, 11–20

**"අසරියාගේ යැදුම"**
**අපගේ මනස්ථාපනය වූ බැගෑපත් හද පිළිගත මැනව.**

අසරියා ගින්න මැද සිටගෙන මේ පිළිවෙලට යාච්ඤා කළේය.

අහෝ ඔබගේ නාමය උදෙසා අපව සදහටම අත් නොහළ මැනව. ඔබගේ ගිවිසුම ප්‍රතික්ෂේප නොකළ මැනව. ඔබගේ මිත්‍රයා වන ආබ්‍රහම් නිසා ද ඔබගේ සේවකයා වන ඊසාක් නිසා ද ඔබගේ ශුද්ධ ජනයා වන ඉශ්රායෙල්වරුන් නිසා ද ඔබගේ කරුණාව අප වෙතින් ඉවත් නොකළ මැනව. අහසේ තාරකා මෙන් ද, මුහුදු වෙරළේ වැලි ඇට මෙන් ද ගණන් නොකළ හැකි පෙළපතක් පෙර කී අයට දීමට ඔබ පොරොන්දු වූ සේක. සමිඳුනි, අපගේ පව් නිසා දැන් අපි සියලු ජාතීන් අතර ඉතා අල්ප ජාතිය වී සිටිමු. ලොව පුරා අපි හෙළා දකිනු ලැබ සිටිමු. මෙකල අපට නායකයෙක් නැත. දිවැසිවරයෙක් නැත. රාජ කුමාරයෙක් නැත. දවන යාග පූජාවක් නැත. පූජා පඬුරක් නැත. ඔප්පු කිරීමට දෙයක් නැත. සුවඳ දුම් නැත.

නාඹුල් පල ඔබට පුදා ඔබේ ප්‍රසාදය දිනා ගැනීමට තැනක් නැත. දවන යාග පූජා සඳහා බැටළුවන් සහ වස්සන් ද තර කළ බැටළු පැටවුන් දහස්

ගණන් ද පිළිගන්නාක් මෙන් අපගේ මනස්ථාපනය වූ සහ බැගෑපත් හද ඔබ පිළිගන්නා සේක්වා. අද අපේ පුද පූජා එසේ පිළිගනු ලැබේවා! ඔබ කෙරෙහි බලාපොරොත්තුව තබන අපගේ බලාපොරොත්තු ඉටු නොවී නොයන බැවින් අපේ මුළු සිත යොදා ඔබ අනුගමනය කිරීම ඔබගේ කැමැත්ත වේවා! ඔබ පසුපස යෑමට ද ඔබට ගරු බිය පෑමට ද ඔබගේ කරුණාව සෙවීමට ද දැන් අපි අපේ මුළු සිත යොදමු. අපගේ බලාපොරොත්තුව කඩ නොකළ මැනව. ඔබ කාරුණික සේ ම අපට ද කාරුණික ලෙස සංග්‍රහ කළ මැනව. බහුලව දයාව පෙන්වුව මැනව.

සමිඳුනි, ඔබගේ අරුම පුදුම ක්‍රියාවලට ඔබින ලෙස අපට විමුක්තිය දුන මැනව. ඔබගේ නාමය මහිමාන්විත කළ මැනව.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 25 : 4–9

පිළිතුර: සමිඳුනි, ඔබේ කරුණා ගුණය සිහි කළ මැනව.

ගීය:

සමිඳුනි, ඔබේ ක්‍රියා මාර්ගය මට හෙළි කළ මැනව. ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව. ඔබේ සත්‍යය අනුව මා ගෙන ගිය මැනව. මට එය ඉගැන්නුව මැනව. මන්ද, ඔබ මාගේ විමුක්තිදායක දෙවිඳාණෝ ය. දවස පුරා ඔබ එන මග බලා සිටිමි.

සමිඳුනි, ඔබේ කරුණා ගුණයත් තිර පෙමත් සිහි කළ මැනව. මේවා ඔබේ චිරාගත ගුණාංගයෝ ය. සමිඳුනි, මාගේ යොවුන් වියේ පාප ද අපරාධ ද සිහි නොකළ මැන. සමිඳුනි, ඔබේ යහපත්කම ද මහා කරුණාව ද අනුව මා සිහි කළ මැනව.

සමිඳාණෝ යහපත් ය. අවංක ය. එතුමාණෝ පව්වුන් හට යා යුතු මාර්ගය උගන්වන සේක. එතුමාණෝ නිහතමානී අය යුක්තියෙහි හසුරුවන සේක. එතුමාණෝ යටහත් පහත් අයට තම මාර්ගය උගන්වන සේක.

## සාධුකාරය

"අවංක පිරිසිදු සිතකින් වචනය අසා පිළිපැද,
නොපසුබට වීර්යයෙන් පල දරණ අය භාග්‍යවන්තයෝ ය.

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 18: 21-35

***ඔබ එකිනෙකාට තම සහෝදරයාට කමා නොකරන්නහු නම් පියාණන් වහන්සේ ද ඔබට කමා නොකරන සේක.***

පේදුරු ජේසුස් වහන්සේ වෙතට අවුත් "ස්වාමිනි, මට විරුද්ධව පව් කරන මාගේ සහෝදරයාට මා කීවාරයක් කමා විය යුතුද? සත් වාරයක් දක්වා

දැ"යි උන් වහන්සේගෙන් ඇසීය. ජේසුස් වහන්සේ ඔහුට කතා කොට "සත් වාරයක් නොව සත් වාර සැත්තෑවකැ"යි වදාළ සේක.

"ස්වර්ග රාජ්‍යය මෙවැන්නකට උපමා කළ හැකිය. සිය දාසයන් සමග ගණන් හිලව් බැලීමට තීරණය කරගත් රජෙක් විය. ඔහු එසේ කරන්නට පටන් ගත් කල රුපියල් දෙකෝටියක් පමණ ණය වූ කෙනෙක් ඔහු වෙත ගෙනෙන ලද්දේය. ණය ගෙවීමට ඔහුට කිසිවක් නොතිබුණ බැවින් ස්වාමියා ඔහු ද ඔහුගේ බිරිඳ හා දරුවන් ද ඔහු සන්තක සියල්ල ද විකුණා ණය ගෙවන්නට අණ කළේය. එවිට ඒ දාසයා දණින් වැටී, "මා ගැන ඉවසන්න. මුළු ණය ගෙවන්නෙමි' යි කීය. ඒ දාසයාගේ ස්වාමියා ඔහු ගැන අනුකම්පාවෙන් පිරී, ඔහු ණයෙන් නිදහස් කොට කමාව දුන්නේය. එහෙත් ඒ දාසයා නික්ම ගොස් තම සහකාර දාසයන් ගෙන් තමාට රුපියන් දෙසීයක් පමණ ණයව සිටි කෙනෙකු දැක, ඔහුගේ බෙල්ල මිරිකා ඔහු අල්ලාගෙන මගේ ණය ගෙවාපන්නැ"යි කීය. එවිට ඔහුගේ සහකාර දාසයා බිම වැටී, "මා ගැන ඉවසන්න. ණය ගෙවන්නෙමි"යි කන්නලව් කරමින් කීය. එහෙත් ඔහු නොඉවසා ණය ගෙවන තෙක් ඔහු හිර අඩස්සි කළේය.

ඔහුගේ සහකාර දාසයෝ සිදු වූ දේ දැක අතිශයින් ශෝක වී අවුත් සිදු වූ සියල්ල තම ස්වාමියාට දැන් වූහ. එවිට ඔහුගේ ස්වාමියා ඔහු කැඳවා කතා කොට, කමකට නැති දාසයා, තුඹේ ඉල්ලීම නිසා මම ඒ ණය සියල්ල තුඹට කමා කළෙමි. මා තුඹට අනුකම්පා කළාක් මෙන් ම, තුඹත් තුඹේ සහකාර දාසයාට අනුකම්පා කළ යුතුව තිබුණා නොවේ දැ"යි ඇසීය. ඔහුගේ ස්වාමියා කෝපව ඔහු තමාට ගෙවිය යුතු සම්පූර්ණ ණය ගෙවන තෙක් ඔහු වධකයන්ට භාර දුන්නේය. ඔබත් එකිනෙකා තමාගේ

සහෝදරයාට මුළු සිතින් කමා නොකරන්නහු නම් ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේ ද එසේම ඔබටත් කමා නොකරනු ඇත.

සුවිශේෂ වාක්‍යය එසේ ය.